


# ටෙස්ට් කඩුලු 300 සමාජයේ පළමු සාමාජිකයා සමුගනියි

එංගලන්තයේ ඕවල් ක්‍රීඩාංගණයේදී මීට වසර 42 කට පෙර ටෙස්ට් කඩුලු 300 ක් දවාගත් පළමුවෙනි පන්දු යවන්නා ක්‍රිකට් ඉතිහාසයට එක්වීම සිදුවිය. අද වනවිට ටෙස්ට් කඩුලු 300 ක් දවා ගැනීම සාමාන්‍යය දෙයක් බවට පත්ව ඇතත් එකල ක්‍රීඩා පිටියෙන් සමුගන්නා විට කිසියම් ක්‍රීඩකයෙකු ටෙස්ට් කඩුලු 300 ක් සම්පූර්ණ කර ගන්නට සමත් වූයේ නම් ඔහු බොහෝදෙනෙකුට පෙනුනේ වීරයෙකු පරිද්දෙනි.

වටිනාකමක් දැනෙන්නේ දුර්ලබ දෙයකය. එම නිසා ටෙස්ට් කඩුලු 300 සමාජයේ ආරම්භක සාමාජිකයා වෙමින් 1964 වසරේදී එංගලන්ත ක්‍රීඩක ෆ්‍රෙඩ් ටෲමන් අසහාය වීරයෙකු ලෙස සැලකුම් ලැබුවේය. ටෲමන් 1952 වසරේ ලීඩ්ස් ක්‍රීඩාංගණයේදී ඉන්දියා-වට එරෙහිව ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයකු බවට පත්ව 1965 වසරේ ලෝඩ්ස් ක්‍රීඩාංගණයේදී නවසීලන්තය සමග සිය අවසන් ටෙස්ට් තරගයට සහභාගි වී තිබුණි.

සිය මංගල ටෙස්ට් තරගයේදී ඉන්දීය ලකුණු පුවරුවට එකම ලකුණක් හෝ එක්වන්නට පෙර කඩුලු 4 ක් දවා ලූ ටෲමන් එම ඉනිමේදී ලකුණු 31 කට කඩුලු 8 ක් දවාගෙන තම හොඳම ඉනිමක කඩුලු දවා ගැනීම සටහන් කළේය.

වසර 13 ක් පුරා පැතිරුණු ටෙස්ට් ක්‍රිකට් චාරිකාව තුළ ටෲමන් කඩුලු 307 ක් දවාගෙන තිබුණි. එය දැන් වැඩිම ටෙස්ට් කඩුලු ලාභී පන්දු යවන්නන්ගේ ලේඛණයේ පසුපසට තල්ලු වී ඇති බව සැබෑය. එහෙත් එක කඩුල්ලක් වෙනුවෙන් ඔහු වැය කර ඇත්තේ ලකුණු 21 ක් වීමත් ඔහු යැවූ සෑම පන්දු 49 කටම කඩුල්ලක් බැගින් දවාගෙන තිබීමත් තවමත් ඉහලම අගයක් හිමිවන දක්ෂතාවන්ය. අකීකරු හා අවුල් වූ කෙහෙරැලි ගුවනේ පාවෙද්දී ඈත කෙලවරේ සිටම පිතිකරුවා වෙත රුදුරු හා තර්ජනාත්මක බැල්මක්ද සහිතව දිව ඒම ටෲමන්ගේ පන්දු යැවීමේ රටාවය.

වේගපන්දු යවන්නන් වෙතින් සුලභව දක්නට ලැබෙන ඉක්මන් කෝපය ෆ්‍රෙඩ් ටෲමන් සතුවද නොඅඩුවම පිහිටා තිබුණි. එබැවින් ඔහුට නිරන්තරයෙන්ම විනය විරෝධී චෝදනා එල්ල විය. එම නරක හැසිරීම ඔහුට වරින් වර කණ්ඩායමේ ස්ථානය අහිමිවීමටද බලපා තිබුණි. එය එසේ නොවූයේ නම් ෆ්‍රෙඩ් ටෲමන් කඩුලු 400 සමාජයේ පළමු සාමාජිකයාවීමේ අවස්ථාවද අපහසුවකින් තොරව හිමි කර ගන්නට තරම් සුදුසුකම් තිබූ පන්දු යවන්නෙකු බව විචාරකයින්ගේ අදහසය. වරක් ඔහු ප්‍රාන්ත ක්‍රිකට් තරගයකදී අවිනීත හැසිරීම පිළිබඳ චෝදනාවකට ගොදුරු වූ අතර ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ යෝක්ෂයර් ප්‍රාන්ත විනය කමිටුව ඔහුට දඬුවම් නියම කළද ඒ වනවිට ඔහු එංගලන්ත පිලට එක්ව රටින් පිටතදී ටෙස්ට් තරගාවලියකට සහභාගි වී සිටි බැවින් ඉන් ගැලවෙන්නට සමත්ව සිටියේය. යෝක්ෂයර් ප්‍රාන්ත කණ්ඩායම නියෝජනය කළ ඔහුගේ වේග පන්දුවේ බලමහිමය නිසාම 60 දශකයේදී එංගලන්ත ප්‍රාන්ත ක්‍රිකට් ශූරතාව 6 වරක්ම දිනා ගන්නට යෝක්ෂයර් ප්‍රාන්තය සමත් වී තිබුණි. ක්‍රිකට් පිටියේදී දැකගත හැකි වූ විශිෂ්ඨ තම පන්දු යවන්නෙකු ලෙස සැලකුම් ලැබූ ටෲමන් ක්‍රීඩාවෙන් සමුගැනීමෙන් පසු බී.බී.සී. මාධ්‍යජාලයට එක්වී විශේෂඥ ක්‍රිකට් විස්තර විචාරකයෙකු ලෙසද කටයුතු කරනු ලැබීය. එහෙත් ටෲමන් සිය ජීවිතයේ අවසන් කාල සීමාවේ පෙනහලු පිලිකාවකට ගොදුරුව යෝක්ෂයර් ප්‍රාන්ත රෝහලක ප්‍රතිකාර ලබමින් සිටියේය.

ඇති වූ සියල්ලන්ම නැති වී යායුතු බැවින් 1931 පෙබරවාරි 6 වැනිදා බිහිවූ ෆ්‍රෙඩ් ටෲමන් නම් අසහාය වේගපන්දු යවන්නා වසර 75 කට පසු පසුගිය ජූලි පළමු වැනිදා සිය ජීව වායුව හිස් අවකාශයට මුසු කර තිබුණි.

# ශ්‍රී ලාංකාව වාර්තා පිට වාර්තා තබයි

## එක්දින ක්‍රිකට් පිටියේ කඩුලු සබඳතා අතර රැඳුනු ආසියානු බල පරාක්‍රමය

ජූලි 4 වන දින නෙදර්ලන්තය සමග පැවැත්වුණ එක්දින ජාත්‍යන්තර ක්‍රිකට් තරගයේදී කඩුලු 9 කට ලකුණු 443 ක ලබා ගනිමින් එක්දින තරග ඉතිහාසයේ කණ්ඩායමක් රැස් කළ වැඩිම ලකුණු ප්‍රමාණය වාර්තා කරන්නට ශ්‍රී ලංකාව සමත් වූවා ය. මේ තරගයේදී සනත් ජයසූරිය ලකුණු 157 ක් ද තිලකරත්න ඩිල්ෂාන් නාදැවී කලණු 117 ක්ද රැස් කළ හ. ශ්‍රී ලංකාව මෙසේ බිඳ දැමුවේ දකුණු අප්‍රිකා කණ්ඩායම ඔස්ට්‍රේලියානු කණ්ඩායමට එරෙහිව ලකුණු 438 ක් ලබා ගනිමින් තැබූ වාර්තාවයි.

ශ්‍රී ලංකාව හා එංගලන්තය අතර පැවැති නැට්වෙස්ට් කුසලාන එක්දින ක්‍රිකට් තරගාවලියේ 5 වැනි හා අවසන් තරගය පසුගිය ජූලි 1 වැනිදා ලීඩ්ස් ක්‍රීඩා පිටියේ පැවැත්විණි.

එම තරගාවලියේ එතෙක් පවත්වන ලද තරග 4 ම ජය ගෙන සිටි ශ්‍රී ලංකා පිලට තරගාවලිය 5-0 ක් ලෙස ජය ගැනීම සඳහා අවසන් තරගයේදී දෙවනුව ලකුණු රැස් කරමින් ලකුණු 322 ක ඉලක්කයක් සපුරා ගැනීමට සිදුවී තිබුණි. ශ්‍රී ලංකා පිලට සාර්ථක ආරම්භයක් ලබාදුන් උපුල් තරංග හා සනත් ජයසූරිය එකී බරපතල අභියෝගය ඉතාමත් පහසු ඉලක්කයක් බවට පත් කළේය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ජයග්‍රහණයට අවශ්‍ය ලකුණු 322 න් 286 ක්ම ඔවුන් දෙදෙනා පළමු කඩුල්ල සඳහා එකතු කරනු ලැබීය. ඉන් එක්දින ක්‍රිකට් ක්‍රීඩාවේ පළමු කඩුල්ල සඳහා අලුත් ලෝක වාර්තාවක් පිහි-ටුවීමටද ඔවුන් දෙදෙනාට හැකියාව ලැබිණි.

එක්දින ක්‍රිකට් ක්‍රීඩාවේ කඩුලු දහය වෙනුවෙන් සටහන්ව ඇති හොඳම සබඳතා අතරට ශ්‍රී ලංකාව එක් වන්නේ සනත් ජයසූරිය හා උපුල් තරංග එක්වී පළමු කඩුල්ල වෙනුවෙන් වාර්තා කළ එම සම්බන්ධතාවය නිසාය.

නොඑසේ නම් පළමු කඩුල්ල සඳහා වූ හොඳම සම්බන්ධයද මෙතෙක් හිමිව තිබුණේ ඉන්දියාවටය. ඒ 2001 - 02 තරග වාරයේ පාල් හිදී කෙන්යාවට එරෙහිව සවුරව් ගන්ගුලි හා සචින් ටෙන්ඩුල්කාර් එක්ව රැස්කර තිබූ ලකුණු 258 ක් සම්බන්දතාවයේ පිහිටෙනි.

කෙසේ වුවත් එක්දින ක්‍රිකට් ක්‍රීඩාවේ කඩුලු 10 සඳහා පිහිටුවා ඇති හොඳම සබඳතා දහයෙන් 5 ක් ඉන්දියාවද එකක් ශ්‍රී ලංකාවද වශයෙන් එහි හයකම අයිතිය ඇත්තේ ආසියාවටය.

ඉතිරි සබඳතා හතරෙන් එක බැගින් ඕස්ට්‍රේලියාව හා බටහිර ඉන්දීය කොදෙව් යන කණ්ඩායම් හිමි කරගෙන සිටින අතර ඉතිරි වාර්තා දෙක කෙන්යාව හා සිම්බාබ්වේ කණ්ඩායම් වලට අයිතිව තිබීම විශේෂත්වයකි.




රාහුල් ඩ්‍රාවිඩ් හා සචින් ටෙන්ඩුල්කාර් 1999 වසරේ හයිද්‍රාබාද් හිදී නවසීලන්තය සමඟ පැවති එක්දින ක්‍රිකට් තරගයේදී දෙවන කඩුල්ල සඳහා ලකුණු 331 ක් වාර්තා කළේය.

එය එක්දින ක්‍රිකට් ක්‍රීඩාවේ ඕනෑම කඩුල්ලක් සඳහා පිහිටුවා ඇති හොඳම සම්බන්ධතාව ලෙස සටහන්ව ඇත.

**කසුන් සේනාරත්න**

